ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2017

## (AA22) පිරිවැය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Cost Accounting and Reporting)

---

මුළුමනින් ප්‍රශ්න 10 ක් සහිත කොටස් 4 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත විය. එමගින් පිරිවැය ගිණුම්කරණයට අදාල මූලික සංකල්ප පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ. අයදුම්කරුවන් සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු විය. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රය සමග අමුණා තිබුණි. ප්‍රශ්න 10 සකසා තිබුණේ පහත සඳහන් පරිදිය:

**A – කොටස -** ලකුණු 20

එකකට ලකුණු 1 ක් හෝ 2 ක් බැගින් වූ එකිනෙකට වෙනස් ස්වරූපයෙන් යුතු වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න සහිත විය. සියලුම ප්‍රශ්න වලට උත්තර ලිවිය යුතු විය.

**B – කොටස -** ලකුණු 25

එකකට ලකුණු 5 ක් බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න පහකි.

**C – කොටස -** ලකුණු 30

එකකට ලකුණු 10 බැගින් වූ අනිවාර්ය ප්‍රශ්න තුනකි.

**D – කොටස -** ලකුණු 25

කොටස් දෙකකින් යුතු එක් අනිවාර්ය ප්‍රශ්නයකි. (A) කොටසට ලකුණු 15 කුත්, (B) කොටසට ලකුණු 10 ක් සහිත එක් අනිවාර්ය ප්‍රශ්නයක් වශයෙනි.

ප්‍රශ්න පත්‍රයේ ප්‍රමිතිය හා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. දී තිබූ උත්තර වලින් පෙනීගිය කාරණයක් වූයේ අයදුම්කරුවන්ගෙන් බහුතරය වෙන් කර තිබූ කාලය නිසිලෙස කළමනාකරණය කරගෙන තිබූ බවයි. එක් එක් ප්‍රශ්නය සඳහා යොදා ගතයුතු කාලය පිළිබඳ මාර්ගෝපදේශය වෙන් කළ ලකුණු මගින් සපයා තිබේ.

# A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

## ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්න මූලික පිරිවැය ගිණුම්කරණ මූලධර්ම සහ මූලික ගණනය කිරීම් කෙරෙහි ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී ඇත. අයදුම්කරුවන් සියලු දෙනාම වාගේ මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි. සමහරු ලකුණු 20 න් සැහෙන ඉහළ ලකුණු ලබා ඇත. කාල අනුපාතික වැටුප් ගෙවීමේ ක්‍රමයේ වාසි සම්බන්ධ ප්‍රශ්න අංක 1.3 ටද, සංකලිත ගිණුම්කරණ ක්‍රමය ගැන වැරදි ප්‍රකාශය හඳුනාගැනීමට තිබූ ප්‍රශ්න අංක 1.5 ටද, අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු ගණනක් ලකුණු ලබා ගැනීමට අපොහොසත් විය. 1 වන ප්‍රශ්නයේ උප කොටස් වල ඇතුලත්ව තිබූ ගිලුනු පිරිවැය (sunk cost), ABC ක්‍රමය හා තත්කාලීන තොග ලැබීමේ ක්‍රමය පිළිබඳ පැහැදිලි දැනුමක් සමහර අයදුම්කරුවන්ට තිබුණේ නැත.

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්නවලට කෙසේ උත්තර ලිවිය යුතුද යන්න සමහර අයදුම්කරුවන් දැන සිටියේ නැත. සමහර අය උත්තරය සමග මුළු ප්‍රශ්නයම නැවත ලියා තිබුණේය. මේ සඳහා ඔවුන්ගේ කාලය අනවශ්‍ය ලෙස මිඩංගු කර ඇත. මෙබඳු ප්‍රශ්නවලට නියමාකාරයෙන් උත්තර ලිවීම සඳහා අයදුම්කරුවන් පිරිවැය ගිණුම්කරණයේ මූලික සංකල්ප පිළිබඳව දැනුවත් විය යුතුය.

# B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

## ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී තිබුණේ පොදුකාර්ය අධි/ඌණ අන්තර්ග්‍රහණය කෙරෙහිය. අයදුම්කරුවන්ගෙන් බහුතරය (a) කොටස සඳහා උත්තර ලියා තිබූ අතර, සැලකිය යුතු තරමේ අයදුම්කරුවන් ගණනක් (b) කොටස සඳහා උත්තර ලිවීමට අපොහොසත් විය. ඔවුන් අන්තර්ග්‍රහණය කළ මුළු පොදුකාර්ය ගණනය කිරීමට නොදැන සිටි අතර, ඒ මත පදනම්ව ඌන / අධි අන්තර්ග්‍රහණ ගණනය කළ යුතුව තිබුණි. ගණනය කිරීම් අනුව පොදුකාර්ය ඌන අන්තර්ග්‍රහණයක් වී ඇති බව හඳුනා ගැනීමට සමහර අයදුම්කරුවන් අසමත් විය.

මෙම පහසු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්නපත්‍රවල සහ ස්ව-අධ්‍යයන පොත්වල ඇති ප්‍රශ්නවලට උත්තර සැපයීමට අයදුම්කරුවන් පුරුදු පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 03

කාර්යයක් සඳහා අය කළ යුතු මිල ගණනය කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය.

අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නය සඳහා ඉහළ ලකුණු ලබාගෙන තිබුණි. ඉතා සරල ගණනය කිරීමක් අවශ්‍ය වුවද, ලාභ ආන්තිකය නිවැරදිව ගණනය කිරීමට සමහර අයදුම්කරුවන් අසමත් විය. සමහර අයදුම්කරුවන් ලාභ ආන්තිකය විකුණුම් මිල ආශ්‍රිතව ගණනය කරනවා වෙනුවට කාර්යයේ මුලු පිරිවැය මත ගණනය කර තිබුණි.

අයදුම්කරුවන් ප්‍රශ්නය ප්‍රවේශමෙන් කියවිය යුතු අතර, ලාභ ආන්තිකය ගණනය කිරීම සඳහා නිවැරදි පදනම යොදා ගත යුතුය. මෙබඳු සරල ප්‍රශ්න සඳහා සම්පූර්ණ ලකුණු උපයා ගැනීමට අංක ගණිතමය නිරවද්‍යතාවද වර්ධනය කරගත යුතුය.

## ප්‍රශ්න අංක 04

අයවැයකරණයේ ප්‍රධාන අරමුණු 3 ක් පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය. මෙය සිද්ධාන්තමය ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නයේ අවශ්‍යතාව නිසිලෙස කියවා නොතිබුණු බව පෙනුණි. අයවැයකරණයේ ප්‍රධාන අරමුණු වෙනුවට, රාජ්‍ය අයවැයෙහි ප්‍රධාන අරමුණු, අයවැයකරණයේ ලක්ෂණ, අයවැය ගණනය කිරීමේ ක්‍රම වැනි අදාල නොවන උත්තර සමහර අයදුම්කරුවන් සපයා තිබුණි.

අයදුම්කරුවන් ප්‍රශ්නය ප්‍රවේසමෙන් කියවා එහි අවශ්‍යතාව, උත්තර ලිවීමට පෙර නිසිලෙස අවබෝධ කරගත යුතුය. මෙබඳු ප්‍රශ්නවලට සාර්ථකව උත්තර ලිවීමට පිරිවැය ගිණුම්කරණ විෂය පිළිබඳව සිද්ධාන්තමය හසල දැනුමක් අයදුම්කරුවන් වර්ධනය කර ගත යුතුය.

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් සංකලිත ගිණුම්කරණ ක්‍රමය කෙරෙහි කේන්ද්‍රගතව තිබූ අතර, අමුද්‍රව්‍ය තොග පාලන ගිණුම, නොනිමි වැඩ පාලන ගිණුම සහ නිමිභාණ්ඩ පාලන ගිණුම පිළියෙල කිරීම අවශ්‍ය විය. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සාර්ථක ලෙස උත්තර ලියා තිබුණේය. එහෙත් සමහර අයදුම්කරුවන් ගිණුම්වල හර, බැර පැති පටලවාගෙන තිබුණි. සමහර අයදුම්කරුවන් පිළිගතහැකි ආකෘතිය මත පිහිටා ගිණුම පිළියෙල කරනවා වෙනුවට එක් එක් ගිණුමේ සටහන් විස්තර කරමින් ප්‍රශ්න සඳහා වෙන්කර තිබූ කාලය අපතේ යවා තිබුණි.

ප්‍රශ්නයට උත්තර ලිවීමට පෙර ප්‍රශ්නය ප්‍රවේශමෙන් කියවීම වැදගත් වේ. තවද, පසුගිය ප්‍රශ්න පත්‍ර සහ ස්ව-අධ්‍යයන පොත ආශ්‍රිතව පුරුදු පුහුණු වීමද අයදුම්කරුවන් විසින් කළ යුත්තේය.

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය, ශ්‍රම පිරිවැය ගණනය කිරීම පිළිබඳ ඉතාමත් සරල ප්‍රශ්නයකි. දී ඇති තොරතුරු ආශ්‍රිතව **පෙරේරා** නමැති සේවකයාගේ මුළු ඉපැයීම් ගණනය කළ යුතු විය. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබා තිබුණි. සමහර අයදුම්කරුවන් ඔවුන්ගේ ගණනය කිරීම්වලදී වැඩකළ සාමාන්‍ය පැය ගණනින් ඉතිරිකළ පැය ගණන අඩුකර තිබුණි.

අයදුම්කරුවන් මේ ආකාරයේ ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණු විය යුතු අතර, ගණනය කිරීමේදී සරල අංක ගණිතමය වැරදි වළක්වා ගත යුතුය.

<u>C කොටස</u>

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නයේදී අන්තර්ග්‍රහණ පිරිවැයකරණ ක්‍රමය යටතේ ආදායම් ප්‍රකාශනයක් අයදුම්කරුවන් විසින් පිළියෙල කිරීම අවශ්‍ය විය.

අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නයේ අවශ්‍යතාවය නිසිලෙස කියවා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා අඩු ලකුණු ලබා තිබුණි. සමහර අයදුම්කරුවන් ප්‍රශ්නයට උත්තර ලිවීමට පවා උත්සාහ කර නොතිබූ බව නිරීක්ෂණය විය.

බොහෝ අයදුම්කරුවන් අවසාන තොගය, ස්ථාවර පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතිකය සහ ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය ඌණ අන්තර්ග්‍රහණය නිවැරදි ලෙස ගණනය කිරීමට අපොහොසත් විය. සමහර අයදුම්කරුවන්ට පොදුකාර්ය ඌණ අන්තර්ග්‍රහණය හඳුනාගැනීමට නොහැකිව තිබූ අතර, සමහරු එය ආදායම් ප්‍රකාශනයේ නිවැරදි ලෙස ගලපා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ අයදුම්කරුවන්ට නිවැරදි ශුද්ධ ලාභය ගණනය කිරීමට නොහැකි විය.

ප්‍රශ්නවලට උත්තර ලිවීමේ හැකියාව වැඩිදියුණු කරගැනීම සඳහා අයදුම්කරුවන් අන්තර්ග්‍රහණ පිරිවැයකරණ ක්‍රමය පිළිබඳ මනා දැනුමක් වර්ධනය කරගත යුතු අතර, ස්ව-අධ්‍යයන පොතෙහි ඇති ප්‍රශ්න පුරුදු පුහුණු විය යුතුය. උත්තර ලිවීමේදී අදාල පෙරවැඩ පෙන්වීම ද වැදගත්ය.

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නයෙන් මාසික පදනම මත මුදල් අයවැය පිළියෙල කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබුණි. අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකු ආදායම සහ වියදම නිවැරදි අන්දමට පුරෝකථනය කර තිබුණි.

අයදුම්කරුවන් කිහිප දෙනෙකු මාසික පදනම මත මුදල් අයවැය පිළියෙල කර තිබුණේ නැත. ඒ වෙනුවට, ඔවුන් මුළු කාර්තුවටම මුළු ගණන් වලින් එය පිළියෙල කර තිබූ අතර, එමනිසා අඩු ලකුණු ලැබීමට හේතු විය. මුදල් අයවැය පිළියෙල කිරීමේදී සමහර අයදුම්කරුවන් වැරදි ලෙසට ක්ෂය පිටතට මුදල් ගලායාමක් ලෙස සලකා තිබුණි. ණයට විකුණුම් සඳහා ගෙවීම් පියවීම ඊළඟ මාසයේදී විය යුතුය යන්න නොසලකා හැරිය සමහරුන් වැරදි ලෙස ඒවා එම මාසයේදීම පියවිය යුතු ලෙස ගෙන ඇත.

අයදුම්කරුවන් අයවැය පිළියෙල කිරීම පිළිබඳ ප්‍රශ්න පුරුදු පුහුණු විය යුතු අතර, අයවැයට අදාල සිද්ධාන්තමය සංකල්ප අධ්‍යයනය කිරීමද වැදගත්ය.

## ප්‍රශ්න අංක 09

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගත වී ඇත්තේ එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුවට පොදුකාර්ය විභජනය කර බෙදාහැරීම පිළිබඳ හැකියාව පරීක්ෂා කිරීම කෙරෙහිය. සේවා දෙපාර්තමේන්තු පිරිවැය බෙදාහැරීමද ඊට ඇතුලත්ය.

අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර, ඉහළ ලකුණුද ලබා තිබුණි. පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර සහ සේවා දෙපාර්තමේන්තු අතර වෙන්කිරීමේ පදනම නිවැරදි ලෙස අයදුම්කරුවන්ගෙන් බහුතරය සිදුකර තිබූ බව උත්තර වලින් නිරීක්ෂණය විය. සේවා දෙපාර්තමේන්තු පොදුකාර්ය නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර බෙදා හැරීමටද නිවැරදි ප්‍රතිශත යොදාගෙන තිබූ බව පෙනී ගියේය.

සමහර අයදුම්කරුවන් වැරදි ලෙස පිරියත සහ උපකරණවල ක්ෂය වෙනුවට පිරියත සහ කාර්යාල උපකරණ පිරිවැය විභජනය කර තිබුණි.

විභාගයේදී උත්තර ලිවීමේ හැකියාව වැඩිදියුණු කර ගැනීම සඳහා අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පොතේ මීට සමාන ප්‍රශ්න සහ පසුගිය විභාගවල ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණු විය යුතුය.

# <u>D කොටස</u>

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක 10

<u>**A කොටස**</u> (වෙන්කළ ලකුණු 15)

ප්‍රධාන වශයෙන් පෙරසැරි ගිණුම්කරණය ගැන අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම කෙරෙහි කේන්ද්‍රගතව තිබුණි.

A නමැති රසායන ද්‍රව්‍ය පිළිබඳව 01 වන සහ 02 වන පෙරසැරි ගිණුම් අයදුම්කරුවන් විසින් පිළියෙල කිරීම අවශ්‍ය විය.

උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය. අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු ගණනක් නිමැවුමෙහි වටිනාකම සහ අසාමාන්‍ය ලාභය සහ අසාමාන්‍ය අපතයෙහි වටිනාකම් ගණනය කරන්නේ කෙසේදැයි දැන සිටියේ නැත. ඔවුන්ට හැකිවී තිබුණේ ප්‍රශ්නයේ කෙලින්ම දී ඇති, විශේෂයෙන් සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ නිෂ්පාදන පොදුකාර්ය වලට අදාල සංඛ්‍යා පෙරසැරි ගිණුමේ නිවැරදිව සටහන් කිරීම නිසා ඒ කොටස වෙනුවෙන් දෙන ලකුණු ලබා ගැනීම පමණය. බහුතරය විසින් නිමැවුමේ වටිනාකම සහ සුන්බුන් අගය නිවැරදිව ගණනය කර නොතිබුණි. සමහර අයදුම්කරුවන් ඒකකයක පිරිවැය ගණනය කිරීමේදී, සාමාන්‍ය අපතය සලකා බලා නොතිබූ අතර, සාමාන්‍ය අපතය සඳහා වැරදි සංඛ්‍යාවන් සැලකිල්ලට ගෙන ඇත.

අයදුම්කරුවන් පෙරසැරි ගිණුම් පිළිබඳව දැනුවත්විය යුතු අතර, සමාන ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණු වීමද කළ යුතුය.

**<u>B කොටස</u>** (වෙන්කළ ලකුණු 10)

මෙම ප්‍රශ්නය ප්‍රධාන වශයෙන් විචලනයන් ගණනය කිරීම කෙරෙහි කේන්ද්‍රගතවූ සරල ප්‍රශ්නයකි. එහෙත්, අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමටවත් නොතිබුණි. මෙම ක්ෂෙත්‍රය පිළිබඳව පැහැදිලි හා තීරණාත්මක දැනුමක් අයදුම්කරුවන්ට නොතිබූ බව නිරීක්ෂණය විය.

සෘජු ද්‍රව්‍ය මිල විචලනය සහ සෘජු ද්‍රව්‍ය භාවිත විචලනය නිවැරදිව ගණනය කර තිබුණ නමුත්, සමහර අයදුම්කරුවන් සෘජුද්‍රව්‍ය පිරිවැය විචලනය ගණනය කර නොතිබූ බව පෙනී ගියේය.

සමහර අයදුම්කරුවන් වැරදි ලෙස සූත්‍ර ලියා තිබූ අතර, සූත්‍රවලට සංඛ්‍යා ආදේශ කිරීමේදී වැරදි සිදුකර තිබුණි. ඇතැම් අයදුම්කරුවන් විචලනය "වාසි" ද "අවාසි" ද යන්න සඳහන් කර තිබුණේ නැත. එමනිසා වෙන්කර තිබූ සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට අයදුම්කරුවන් අසමත් විය.

අයදුම්කරුවන් ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න පත්‍ර හා සමාන විභාග ප්‍රශ්න පත්‍ර පරිශීලනය කර උත්තර ලියා පුරුදු පුහුණු විය යුතුය.

\- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම වැඩිදියුණු කර ගැනීම සඳහා සැලකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කාලයක් දෙනු ලැබේ).

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා සෘජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමට තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සහතික විය යුතුය.

(8) ස්ව-අධ්‍යයන පොත, ලිපි, සඟරා, ආදිය කියවිය යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පෙර ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

\- * * * -